## තේමාව 7 - ආරක්ෂාව හා පරිස්සම

● නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1). ස්වාභාවික අනතුරන් නොවන්නේ

1.කඳු නාය යාම 2.ගංවතුර 3.රිය අනතුරු

2). අකුණු ගසන අවස්ථාවක භාවිතා නොකළ යුතු ක්‍රියාවකි

1.පොතක් බැලීම 2.රූපවාහිනී නැරඹීම 3.නිදා ගැනීම

3). නාය යාමකට පෙර පොළොවේ සිදු විය හැකි ක්‍රියාවකි

1.මෙරු මතු වීම 2.බොර වතුර මතු වීම 3.කූඹි මතු වීම

4). ස්වාභාවික අනතුරු ගැන දැන ගැනීමට අවධානය යොමු නොකළ යුතු දෙයකි

1.පරිසරයේ වෙනස් වීම් 2.සතුන්ගේ හැසිරීම 3.මිනිසුන්ගේ හැසිරීම

5). සර්ප දෂ්ට කිරීම්වලින් බේරීමට කළ යුතු දෙයකි

1.ශබ්ද නගා ඇවිදීම 2.පාවහන් පැලඳීම 3.සර්පයන්ට පහර දීම

6). බල්ලකු සපා කෑම නිසා ඇතිවන රෝගයකි

1.මී උණ 2.දියවැඩියාව 3.ජලභීතිකාව

7). ගෙවත්තේ දී විය හැකි අනතුරකි

1.දියේ ගිලීම 2.ගසකින් වැටීම 3.පන්දුවක් වැදීම

8). ගෑස් කාන්දු වීමක් සිදු විය හැකි ස්ථානයකි

1.නිවස 2.පාසල 3.මහා මාර්ගය

9). විදුලි අනතුරුවලින් විය හැකි හානියක් වන්නේ

1.ගිනි ගැනීම 2.ඇද වැටීම 3.ක්ලාන්තය

10). කැපීම් නිසා අනතුරු විය හැකි උපකරණයකි

1.මුල්ලුව 2.අලවංගුව 3.කැත්ත

11). ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු දෙයකි

1.ඖෂධයේ අඩංගු දේ 2.ගන්නා මාත්‍රාව 3.ඖෂධයේ වෙළඳ නාමය

12). උණු වතුරට පිළිස්සීමක දී නොකළ යුතු දෙයකි

1.ගලා යන ජලය දැමීම 2.දන්තාලේප තැවරීම 3.තුවාලය ආවරණය කිරීම

13). ප්‍රථමාධාර පෙට්ටියක නොතිබිය යුතු දෙයකි

1.වෙළුම් පටි 2.කතුර 3.පිහිය

14). අනතුරක දී ප්‍රථමාධාර ලබා දිය යුත්තේ

1.රෝහලට යාමෙන් පසු 2.රෝහලට යාමට පෙර 3.අනතුරට පෙර

15). ඖෂධ පැවතිය හැකි ආකාරයක් නොවන්නේ

1.පෙති 2.කරල් 3.ලෝහ

16). සමාජ විරෝධී ක්‍රියාවක් වන්නේ

1.මත් ද්‍රව්‍ය වෙළඳාම 2.රිය අනතුරු 3.ආහාර විෂ වීම

17). අනතුරුදායක අවස්ථාවක දී නොකළ යුතු දෙයකි

1.එම ස්ථානයෙන් ඉවත් වීම 2.උදවු ඉල්ලීම 3.අනතුර ඇති තැනට යාම

18). සමාජ විරෝධී ක්‍රියාවන් පිළිබඳ ව පොලිසියට දැනුම් දෙන දුරකථන අංකය වන්නේ

1. 120 2. 119 3. 210

19). ළමා උපකාරක සේවය පිළිබඳ දුරකථන අංකය වන්නේ

1. 1930 2. 1122 3. 1929

20). හදිසි අනතුරක දී අපගේ පිහිටට එන ගිලන් රථ සේවය වන්නේ

1.සුවසැරිය 2.සිසුසැරිය 3.සුවමග

21). සුවසැරිය ගිලන් රථ සේවාවේ දුරකථන අංකය වන්නේ

1. 1919 2. 1930 3. 1990

22). සමාජ විරෝධී ක්‍රියාවන්වල යෙදෙන අයට සිදු නොවන දෙයකි

1.අන් අයගේ උදවු ලැබීම 2.අපකීර්තියට පත් වීම 3.ආත්ම ගරුත්වය කෙළෙසීම

23). බෝ නොවන රෝගවලින් ආරත්ෂා වීමට අනුගමනය කළ යුතු දෙයකි

1.නිතර ආහාර ගැනීම 2.පැකට් කළ ආහාර ලබා ගැනීම 3.නිවැරදි ආහාර රටා

24). ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීමට කළ යුතු දෙයකි

1.පරිසරය පිරිසිදු කිරීම 2.වෛද්‍ය ප්‍රතිකාර ලැබීම 3.මදුරු දැල් යොදා ගැනීම

25). අනතුරුදායක අවස්ථා හඟවන වර්ණයකි

1.නිල් 2.කොළ 3.රතු